# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 23 දරන ප්‍රජා සුවසාධන හා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ **2007** ජූලි මස **05** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 ජූලි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ **:** රු. **6.00** යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

**2007 අංක 23 දරන ප්‍රජා සුවසාධන හා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 05 වන දින]

එල්. ඩී.—ඕ. 11/2005

## ප්‍රජා සුවසාධන හා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ප්‍රජා සුවසාධන හා සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ හා සම්බන්ධ සියලු පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් අරමුණු හා කාරණා සඳහා ද, ඒ අරමුණු සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 23 දරන ප්‍රජා සුවසාධන හා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රජා සුවසාධන හා සංවර්ධන පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ප්‍රජා සුවසාධන සංවර්ධන පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ද ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. ප්‍රජා සුවසාධන හා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:– සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශාරීරික, මානසික, චිත්ත වේගීය, මනස් සාමාජික සහ උසස් මානසික ශුභ සාධනය ඇතුළත් "සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්" දිරි ගැන්වීම මගින් තැනැත්තන්ගේ සුවසාධනය, වැඩීම හා සංවර්ධනය සඳහා කටයුතු කිරීම ;

2-P L 001852- 2,800 (2007/03)

(ආ) විවිධ වයස් කාණ්ඩවලට අයත් මනස් සාමාජීය වශයෙන් පීඩාවට පත් හා මනෝ විද්‍යාත්මකව කම්පනයට පත් තැනැත්තන්ගේ සහ ශාරීරික හෝ මානසික වශයෙන් බෙලහීනත්වයට පත් තැනැත්තන්ගේ යහපත උදෙසා වන සුරැකීමේ, පුනරුත්ථාපනය කිරීමේ, සුවසාධනය කිරීමේ කටයුතු සඳහා "සහන සෙවණ" යනුවෙන් හඳුන්වනු ලබන සහන නිවාසයක් පවත්වාගෙන යාම ;

(ඇ) මනස් සාමාජීය වශයෙන් පීඩනයට ලක් තැනැත්තන් සහ ළමයින් සඳහා දිවි නසා ගැනීම වැළැක්වීම සම්බන්ධ අධ්‍යයන, වැඩසටහන් සහ පර්යේෂණ කටයුතු පැවැත්වීම සහ එවැනි තැනැත්තන්ගේ සහ සමස්තයක් වශයෙන් සමාජයේ යහපත උදෙසා අදාළ බලධාරීන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට ඵලදායී යෝජනා ඉදිරිපත් කිරීම ;

(ඈ) විවිධ මනෝවිද්‍යාත්මක හා සාමාජීය විෂයයන්, මානසික සහන කටයුතු, පුනරුත්ථාපනය, උපදේශනය සහ මාර්ගෝපදේශන කටයුතු පිළිබඳ අධ්‍යාපනය හා දැනුම පතුරුවා හැරීම ;

(ඉ) ජීවිතයේ අරමුණු ඇති කිරීම, සියදිවි නසා ගැනීම වැළැක්වීම, පෞරුෂ වර්ධනය සහ ස්වයං විශ්වාසය ඉහළ නැංවීම අරමුණු කරගෙන අවශ්‍යතා ඇති ළමයින්, තරුණයන්, යෞවනයන් සහ වැඩිහිටියන්ගේ යහපත සඳහා මානසික සහන හා උපදේශන මධ්‍යස්ථාන, මාර්ගෝපදේශක මධ්‍යස්ථාන පිහිටුවීම ;

(ඊ) සාමය, එකමුතුව, සදාචාරාත්මක වටිනාකම් ඇති කිරීමේ අරමුණ ඇතිව අඩුතරමින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව දිරිගැන්වීමත්, ප්‍රධාන ආගම් හතර පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම පිළිබඳව දැනුමක් ලබා දීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් දිරිමත් කිරීම;

(උ) ජනතාවගේ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීමේ අරමුණු ඇතිව තරුණ තරුණියන්ගේ සහ පවුල්වල ප්‍රධාන ආදායම් මාර්ගවලට අමතරව නිවාස පදනම් කරගත් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වල නියැළීමට ඔවුන් දිරි ගැන්වීම ;

4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ එකතු කිරීමේ ද දීමනා සහ පරිත්‍යාග ලබා ගැනීම හෝ එකතු කිරීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද, නිලධරයන් සහ සේවකයන් සේවයේ යෙදවීමේ, නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ කිරීමේ, ඉටුකිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීති අනුව තෝරා පත් කර ගනු ලබන විධායක කමිටුවක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ රීතිවලට යටත්ව කළමනාකරණය කළ යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව, මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී තනතුරු දැරුවා වූ පදනමේ විධායක කමිටුවේ සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය.

6. (1) පහත දැක්වෙන සියලුම කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් ඇතුළු කර ගැනීම, වර්ග කිරීම සහ ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම හා ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සංස්ථාවේ සහ විධායක කමිටුවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාව, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා රැස්වීම්වල ගණපූරණය හා රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙනයාම හා ඒවා විගණනය කිරීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු ම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථා විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාග කිරීමක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන්‍යාකාරයකින් චංචල හා නිශ්චල දේපළ අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් හැකි විය යුතු අතර, මේ පනතේ කාර්යය සඳහා එවැනි සියලු දේපළ සංස්ථාව විසින් දැරීමට ද සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, එම දේපළ විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සංස්ථාවට සම්පූර්ණ බලය තිබිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවැති සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු ණය, දායක මුදල් හා සම්මාදම් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

9. (1) සංස්ථාවේ මුදල් වර්ෂය සෑම වර්ෂයක ම අප්‍රේල් පළමු වන දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු තිස් එක් වන දින දක්වා විය යුත්තේ ය ; විගණනය හා ගිණුම්.

(2) සංස්ථාවේ ආදායම් හා වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ම ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලැබිය යුත්තේ ය ;

(3) සංස්ථාවේ ගිණුම් විධායක කමිටුව විසින් පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කළ යුතු ය ;

මෙම වගන්තියෙහි "සුදුසුකම්ලත් විගණකවරයා" යනුවෙන් —

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන එකී ආයතනයේ පාලක මණ්ඩලය විසින් ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීම සඳහා නිකුත් කළ සහතිකයක් සන්තකයේ ඇති තැනැත්තකු ; හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන, එකී ආයතනයේ එක් එක් නේවාසික හවුල්කරුවන් සහිත ගණකාධිකාරී පාලක මණ්ඩලය විසින් ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියේ යෙදීම සඳහා නිකුත් කළ සහතිකයක් සන්තකයේ ඇති ගණකාධිකාරී ආයතනයක්,

අදහස් කෙරේ.

10. සංස්ථාවේ සභාපතිවරයා ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔහු නොපැමිණි විටක, උපසභාපතිවරයකු සහ භාණ්ඩාගාරික හෝ ලේකම්වරයා විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය. තවද, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**11**. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව, යම් දේපළක් හෝ යම් ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.